# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1979 අංක 63 දරන
# පලාත් පාලන නිවාස (සංශෝධන)
# පනත

[සහතිකය සටහන් කළේ 1979 ඔක්තෝබර් මස 15 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1979 ඔක්තෝබර් මස 19 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

---

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැක

මිළ : ශත 45 යි. තැපැල් ගාස්තුව : ශත 25 යි.

## 1979 අංක 63 දරන පළාත් පාලන නිවාස (සංශෝධන) පනත

**[සහතිකය සටහන් කළේ 1979 ඔක්තෝබර් මස 15 වන දින]**

**එල්. ඩී.—ඕ. 30/79.**

**1964 අංක 14 දරන පළාත් පාලන නිවාස පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

**1.** මේ පනත 1979 අංක 63 දරන පළාත් පාලන නිවාස (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. **ලුහුඬු නාමය.**

**2.** (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1964 අංක 14 දරන පළාත් පාලන නිවාස පනතේ 3 වන වගන්තියේ (3) වන උපවගන්තියේ (ආ) ඡේදය වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:— **1964 අංක 14 දරන පනතේ 3 වන වගන්තිය සංශෝධනය කිරීම.**

"(ආ) ඒ පළාත් පාලන ආයතනය විසින් ඒ නිවාසය වෙනත් යම් තැනැත්තකුට එසේ කුලියට දීමට ඇති ස්වකීය අදහස පිළිබඳව, පළමුවෙන් සඳහන් කළ තැනැත්තා වෙත මාස හයක ලිඛිත දැනුම් දීමක් කරනු ලැබ, ඒ පළාත් පාලන ආයතනය විසින්, පළමුවෙන් සඳහන් කළ තැනැත්තාට, විකල්ප නිවාස පහසුකම් සලස්වනු ලබන්නේ නම් මිස".

**3.** 5 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය ඇතුළත් කරනු ලබන අතර, එය ප්‍රධාන ප්‍රඥප්තියේ 5අ වගන්තිය වශයෙන් බලාත්මක විය යුතු ය:— **ප්‍රධාන ප්‍රඥප්තියෙහි 5අ අලුත් වගන්තිය ඇතුළත් කිරීම.**

"මේ පනත අදාළ වන ඇතැම් නිවාස පැවරීමට පළාත් පාලන ආයතනය සතු බලය.

5අ. (1) මේ වගන්තිය ක්‍රියාත්මක වන දිනයට පෙර, මේ පනත අදාළ වන නිවාසයක් 3 (1) වන වගන්තියේ විධිවිධාන යටතේ යම් තැනැත්තකුට කුලියට දෙනු ලැබ, ඒ කුලියට දීමට පෙරාතුව ම ඒ නිවාසයේ මාසික කුලිය රුපියල් විසි පහක් නොඉක්ම වූ අවස්ථාවක, ඒ නිවාසය පිහිටා ඇත්තේ යම් පළාත් පාලන ආයතනයක පරිපාලන සීමා ඇතුළත ද ඒ පළාත් පාලන ආයතනය විසින් දේපළ බැහැර කිරීමේ සාධන පත්‍රයක් මගින් ඒ නිවාසය ඒ තැනැත්තාට අය කිරීමක් නොමැතිව පවරා දෙනු ලැබිය යුතු ය.

(2) මේ වගන්තිය ක්‍රියාත්මක වන දිනයට පෙර, මේ පනත අදාළ වන නිවාසයක් 3 (1) වන වගන්තියේ විධිවිධාන යටතේ නොවන ආකාරයකින් යම් තැනැත්තකුට කුලියට දෙනු ලැබ, ඒ නිවාසයේ මාසික කුලිය රුපියල් විසි පහක් නොඉක්මවන අවස්ථාවක දී, ඒ නිවාසය පිහිටා ඇත්තේ යම් පළාත් පාලන ආයතනයක පරිපාලන සීමා ඇතුළත ද ඒ පළාත් පාලන ආයතනය විසින්, දේපළ බැහැර කිරීමේ සාධන පත්‍රයක් මගින්—

(අ) මේ වගන්තිය ක්‍රියාත්මක වන දිනයේ දී ඒ නිවාසයේ පදිංචිව සිටින කුලී නිවැසියාට ; හෝ

(ආ) මේ වගන්තිය ක්‍රියාත්මක වන දිනයේ දී ඒ නිවාසයේ කුලී නිවැසියා එහි පදිංචිව නොසිටින අවස්ථාවක, ඒ දිනයේ දී ඒ නිවාසයේ පදිංචිව සිටින තැනැත්තාට,

ඒ පළාත් පාලන ආයතනය සඳහා පිහිටුවන ලද උපදේශක මණ්ඩලය—

(i) අවස්ථාවෝචිත පරිදි, ඒ කුලී නිවැසියාට හෝ ඒ පදිංචිව සිටින තැනැත්තාට හෝ නිවාස ඉඩකඩ අවශ්‍යව තිබෙන බවට,

(ii) අවස්ථාවෝචිත පරිදි, ඒ කුලී නිවැසියා හෝ ඒ පදිංචිව සිටින තැනැත්තා හෝ ශ්‍රී ලංකාවේ පුරවැසියකු බවට, සහ

(iii) අවස්ථාවෝචිත පරිදි, ඒ කුලී නිවැසියාගේ හෝ ඒ පදිංචිව සිටින තැනැත්තාගේ හෝ නම, ඒ පළාත් පාලන ආයතනයේ සභිකයන් තේරීමේ මහා ඡන්ද විමසීම සඳහා සකස් කරන ලද ඡන්දදායක ලැයිස්තුවේ දැක්වෙන බවට,

සෑහීමට පත් වන්නේ නම් සහ එසේ වන්නේ නම් පමණක් ඒ නිවාසය අය කිරීමක් නොමැතිව පවරා දෙනු ලැබිය යුතු ය.

(3) (2) වන උපවගන්තියේ සඳහන් නිවාසයක අවස්ථාවෝචිත පරිදි, කුලී නිවැසියා හෝ පදිංචිව සිටින තැනැත්තා හෝ ඒ උපවගන්තියේ (i), (ii) හා (iii) ඡේදවල දක්වා ඇති නියමයන් සපුරා නොමැති බව, පළාත් පාලන ආයතනයක් සඳහා පිහිටුවන ලද උපදේශක මණ්ඩලය විසින් තීරණය කරනු ලබන අවස්ථාවක,—

(අ) අවස්ථාවෝචිත පරිදි, ඒ කුලී නිවැසියා හෝ ඒ පදිංචිව සිටින තැනැත්තා හෝ විසින්, ඒ තීරණය තමා වෙත දන්වා එවූ දින සිට දින දහහතරක් ඇතුළත, පළාත් පාලන විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත ඒ තීරණයට විරුද්ධව අභියාචනයක් කළ හැකි ය. එවැනි යම් අභියාචනයක් සම්බන්ධයෙන් ඒ ලේකම්වරයාගේ තීරණය අවසානාත්මක වන්නේ ය ; තවද

(ආ) ඒ නිවාසය පිහිටා ඇත්තේ යම් පළාත් පාලන ආයතනයක පරිපාලන සීමා ඇතුළත ද ඒ පළාත් පාලන ආයතනය විසින් දේපළ බැහැර කිරීමේ සාධන පත්‍රයක් මගින්, එකී නියම සපුරාලන යම් තැනැත්තකුට ඒ නිවාසය ගාස්තුවක් නොමැතිව පවරා දෙනු ලැබිය හැකි ය.

(4) පළාත් පාලන ආයතනයක් විසින්, (3) වන උපවගන්තියේ (ආ) ඡේදය යටතේ නිවාසයක් පවරා දීම—

(අ) ඒ පළාත් පාලන ආයතනය සඳහා පිහිටු වන ලද උපදේශක මණ්ඩලයේ පූර්ව අනුමතය ඇතිව හැර,

(ආ) ඒ පළාත් පාලන ආයතනය විසින් එම නිවාසය වෙනත් යම් තැනැත්තකුට එසේ පැවරීමට ඇති ස්වකීය අදහස පිළිබඳව, අවස්ථාවෝචිත පරිදි, ඒ නිවාස යෙහි කුලී නිවැසියා හෝ පදිංචිව සිටින තැනැත්තා හෝ වෙත, මාස හයක ලිඛිත දැනුම් දීමක් දෙනු ලැබ, ඒ පළාත් පාලන ආයතනය විසින්, අවස්ථාවෝචිත පරිදි, ඒ කුලී නිවැසියා හෝ ඒ පදිංචිව සිටින තැනැත්තා හෝ සඳහා විකල්ප වශයෙන් ඉඩ පහසුකම් සපයනු ලබන්නේ නම් මිස ; සහ

(ඇ) අවස්ථාවෝචිත පරිදි, ඒ නිවාසයේ කුලී නිවැසියා හෝ එහි පදිංචිව සිටින තැනැත්තා හෝ විසින් (3) වන උපවගන්තියේ (අ) ඡේදය යටතේ ඉදිරිපත් කරනු ලබන යම් අභියාචනයක් නිෂ්ප්‍රභ කරනු ලබන තෙක් සහ නිෂ්ප්‍රභ කරනු ලැබ තිබේ නම් මිස,

කරනු නොලැබිය යුතු ය.

(5) (1) වන උපවගන්තිය හෝ (2) වන උපවගන්තිය හෝ (3) වන උපවගන්තිය හෝ යටතේ පැවරීමක් ක්‍රියාත්මක කරන දේපළ බැහැර කිරීමේ යම් සාධන පත්‍රයකට, වංචා වැළැක්වීමේ ආඥාපනතෙහි කිසිවක් අදාළ නොවිය යුතු අතර, ඒ සම්බන්ධයෙන්, කිසිම මුද්දර ගාස්තුවක් නොගෙවිය යුතු ය. දේපළ බැහැර කිරීමේ එවැනි යම් සාධන පත්‍රයක් ලියා අත්සන් කරන පළාත් පාලන ආයතනය විසින්, ලියාපදිංචි කිරීම සඳහා එහි පිට පතක්, ඒ සාධන පත්‍රය මගින් පවරන ලද නිවාසය පිහිටි දිස්ත්‍රික්කයේ ඉඩම් රෙජිස්ට්‍රාර් වරයා වෙත ඉදිරිපත් කරනු ලැබීමට සැලැස්විය යුතු ය. එවැනි ලියාපදිංචි කිරීමක් සම්බන්ධයෙන් කිසිම ගාස්තුවක් නොගෙවිය යුතු ය.

(6) මේ වගන්තිය යටතේ නිවාසයක් පැවරීමේ දී පළාත් පාලන ආයතනයක් විසින් දරන ලද සියලු වියදම් ඒ පළාත් පාලන ආයතනයේ අර මුදල්වලට වැය බරක් වන්නේ ය.".

ප්‍රධාන ප්‍රඥප්තියෙහි 11අ අලුත් වගන්තිය ඇතුළත් කිරීම.

4. පහත දැක්වෙන අලුත් වගන්තිය, 11 වන වගන්තියට ඉක් බිතිව ම ඇතුළත් කරනු ලබන අතර, එය ප්‍රධාන ප්‍රඥප්තියේ 11අ වගන්තිය වශයෙන් බලාත්මක විය යුතු ය:—

"පළාත් පාලන ආයතනවල නිලධරයන්ට, හෝ සේවකයන්ට කුලියට දී තිබෙන්නා වූ ද මේ පනත අදාළ වන්නා වූ ද නිවාසවලට මේ පනත අදාළ නොවිය යුතු බව.

11අ. මේ පනත අදාළ වන්නා වූ ද, පළාත් පාලන ආයතනයක් විසින් ඒ පළාත් පාලන ආයතනයේ නිලධරයකුට හෝ සේවකයකුට හෝ නිල නිවාස වශයෙන් කුලියට දී තිබෙන්නා වූ ද යම් නිවාස යකට හෝ ඒ සම්බන්ධයෙන් හෝ මේ පනතේ කිසිවක් අදාළ නොවිය යුතු ය.".

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත්වල සහ නීතිවල වාර්ෂික දායක මිල (දේශීය) රු. 30 කි. (විදේශීය) රු. 40 කි. කොළඹ 1, තැ. පෙ. අංක 500, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත හැම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබා ගත හැකිය. මුදල් ගෙවූ දිනට කලින් නිකුත් කරන ලද පනත් කෙටුම්පත් සහ නීති සැපයීමේ කොන්දේසිය මත ප්‍රමාද දායක මුදල් භාරගනු ලැබේ.